ජා ඇල නගර සභාව

2027 වර්ෂය සඳහා

සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කර ගැනීම

මෙහි පහත සඳහන් භාණ්ඩ හා සේවාවන් 2027 වර්ෂය තුළදී සැපයීම සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කරවා ගැනීම පිණිස නිෂ්පාදකයන්ගෙන් හා ලියාපදිංචි ආයතන වලින් අයදුම්පත් කැඳවනු ලැබේ.

භාණ්ඩ සැපයීම

1. කාර්යාලීය ලිපි ද්‍රව්‍ය (පෑන්/පැන්සල් / කඩදාසි වර්ග / ෆයිල් කවර /ගම් බෝතල්/ ටිපෙක්ස් ආදිය)
2. කාර්යාල ගෘහ භාණ්ඩ (ලී බඩු / වානේ අල්මාරි /මේස / ප්ලාස්ටික් පුටු ආදිය)
3. කාර්යාල උපකරණ (ඡායා පිටපත් යන්ත්‍ර / ෆැක්ස් යන්ත්‍ර / ඇඟිලි සළකුණු යන්ත්‍ර / මුදල් ගණින යන්ත්‍ර / අනු ඡායා පිටපත් යන්ත්‍ර ආදිය)
4. පරිගණක යන්ත්‍ර / මුද්‍රණ යන්ත්‍ර හා පරිගණක උපකරණ ආදිය
5. මුද්‍රණ යන්ත්‍ර හා ඡායා පිටපත් යන්ත්‍ර සඳහා යොදන ටෝනර්/රිබන්/කාට්රිජ් ආදිය
6. විදුලි උපකරණ / වීථි පහන් හා උපකරණ /සියළුම ඉලෙක්ට්‍රොනික් උපකරණ
7. සෞඛ්‍ය හා සනීපාරක්ෂක ද්‍රව්‍ය සහ උපකරණ (කොසු / ඉදල් / වේවැල් කූඩ / කාණු බුරුසු / විෂබීජ නාශක / සබන් / එන්නත් කටු / අත්මේස් /ගම්බුට්ස් / වැහි කබා / කසල කරත්ත/කසළ මලු ආදිය)
8. වාහන ටයර් / ටියුබ් ආදිය
9. වාහන බැටරි
10. වාහන අමතර කොටස්/ඇන්ජින් අමතර කොටස් ආදිය
11. වාහන බලපත්‍ර තහඩු / වරිපනම් තහඩු
12. මාර්ග හා ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය (කළු ගල් /ගංගා වැලි / ගඩොල් / සිමෙන්ති / කම්බි/ සෙවිලි තහඩු / උළු / බොරළු පස් / ගල් පස් /චිප්ගල්/ඒබීසී ආදිය)
13. සියළුම වර්ග වල හියුම් පයිප්ප / කම්බි කණු ගල් / බ්ලොක් ගල් හා කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන
14. තාර සැපයීම (80/100,CSS 1, CRS 1)
15. නිල ඇඳුම් රෙදි / මසා නිම කළ නිල ඇඳුම් /පාවහන්
16. නිල හැඳුනුම්පත් සැකසීම
17. ඉරන ලද දැව සැපයීම (පරාල / ලෑලි / රීප්ප /පොල් ලී /සැටලිං ආදිය)
18. ක්‍රීඩා භාණ්ඩ සහ පෙර පාසල් උපකරණ
19. හාඩ්වෙයාර් උපකරණ (සියළුම වර්ගයේ හාඩ්වෙයාර් උපාංග/ ආලේපන වර්ග / පොලිතින් /ජල නළ උපාංග ආදිය)
20. ශිලා ඵලක / සිහිවටන ඵලක/කුසලාන ආදිය
21. ආහාර පාන ආදිය සැපයීම
22. කෘමි නාශක / වල් නාශක සහ පොහොර වර්ග /දුගඳ පාලන දියර
23. පැළ වර්ග සැපයීම
24. පුස්තකාල පොත්/සඟරා
25. එල්.පී ගෑස් සැපයීම
26. කම්මල් බඩු (සවල්/ උදළු/ මන්නා / පිහි ආදිය)

සේවා සැපයීම

27. කාර්යාලීය මුද්‍රණ කටයුතු
28. කාර්යාලීය ගෘහ භාණ්ඩ අළුත්වැඩියාව (ලීබඩු / වානේ මේස/ කබඩ් ආදිය)
29. කාර්යාලීය උපකරණ අළුත්වැඩියාව හා සේවා කටයුතු කිරීම (පරිගණක යන්ත්‍ර /මුද්‍රණ යන්ත්‍ර/ෆැක්ස් යන්ත්‍ර / ඡායා පිටපත් යන්ත්‍ර ආදිය)
30. අභ්‍යන්තර දුරකථන පද්ධති / පරිගණක ජාල/ සී.සී.ටී.වී අළුත්වැඩියාව හා නඩත්තුව
31. වාහන අළුත්වැඩියාව (යාන්ත්‍රික/විදුලි පද්ධති/ ටින්කර් සහ පේන්ට්/වායු සමන පද්ධති ආදිය)
32. වාහන සීට් කවර සැකසීම හා කුෂන් කිරීම
33. වාහන සේවා කිරීම
34. වාහන (ටියුබ් බද්ධ කිරීම / වෝල්කනයිස් කිරීම / ටයර් නැවත පිරවීම / ටයර් බැටරි සැපයීම / ටයර් මාරු කිරීමේ සේවා ආදිය)
35. වාහන හා යන්ත්‍රෝපකරණ කුලියට සැපයීම. (මෝටර් ග්‍රේඩර් / මාර්ග තලන යන්ත්‍ර / ජෙනරේටර් / කම්පන තලන / ට්‍රැක්ටර් / වෑන් / ත්‍රීවිල්ර් / ටිපර් රථආදිය)
36. බලයලත් මිනින්දෝරු සේවා (ඉඩම් හා මාර්ග)
37. ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට සැපයීම හා ආලෝකකරණ ද්‍රව්‍ය සැපයීම
38. මදුරු තෙල් ඉසින යන්ත්‍ර / ධූමායන යන්ත්‍ර හා තණකොළ කපන යන්ත්‍ර අළුත්වැඩියාව හා නඩත්තුව
39. කුලී පදනම මත උත්සව භාණ්ඩ සැපයීම
40. ඩිජිටල් බැනර් / නාම පුවරු / දැන්වීම් පුවරු සෑදීම
41. අනතුරු දායක ගස් කැපීම් කිරීම හා ගස් වල අතු කපන්නන්
42. පරණ පුවත්පත් / පරණ යකඩ / හිස් බෝතල් / භාවිතයෙන් ඉවත් කළ බල්බ් මිළදී ගන්නන්
43. වායු සමීකරණ අළුත්වැඩියාව
44. සභා දේපළ රක්ෂණය කිරීම, මුදල් රක්ෂණය
45. නීතිඥ සේවා
46. ආදාහනාගාර අළුත්වැඩියාව හා නඩත්තුව
47. භාෂා පරිවර්තන සේවා සැපයීම
48. ජෙනරේටර්/මෝටර් වැනි විදුලි උපකරණ නඩත්තුකරුවන්
49. ප්‍රවාහන පහසුකම් ලබා ගැනීම සඳහා (වායු සමීකරණය කළ/ වායු සමීකරණය නොකළ)වාහන කුලියට සැපයීම
50. වතුර බවුසර් / ගලි බවුසර් සේවා කුලියට සැපයීම

කොන්ත්‍රාත්කරුවන් සඳහා ලියාපදිංචි ගාස්තු

අංක	මුදල් සීමාව	ලියාපදිංචි ගාස්තු
01	රු:1.00 - රු:500,000.00 දක්වා	රු:2,000.00
02	රු:500,000.00 සිට රු:2,000,000.00 දක්වා	රු:3,000.00
03	රු:2,000,000.00 සිට රු:5,000,000.00 දක්වා	රු:4,000.00
04	රු:5,000,000.00 ට වැඩි	රු:5,000.00

කොන්දේසි

1. සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වීම සඳහා ඉදිරිපත්වන්නන් පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත පරිදි සකස් කර ගන්නා ලද අයදුම්පත්‍රය සම්පූර්ණ කර ලියාපදිංචි ගාස්තුව ගෙවා ඒ සමග අදාළ සහතිකවල පිටපත් සහ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයද ඉදිරිපත් කළ යුතුය.
2. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2026.11.16** දින **ප.ව.2.00** ට පෙර **සභාපති,ජා ඇල නගර සභාව,ජා ඇල** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් ගෙවීම් කටයුතු සිදු කොට භාර දිය හැකිය.අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවර **"සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම 2027"** යනුවෙන් සඳහන් කළ යුතුය.
3. එක් අයිතමයකට රු:2000.00 ක ගාස්තුවක් සහ කොන්ත්‍රාත් සඳහා මුදල් සීමාව අනුව ඉහතින් දක්වා ඇති පරිදි ගෙවිය යුතු අතර,අයිතමයන් කිහිපයකට ලියාපදිංචි වන්නේ නම් එක් එක් අයිතමය සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වන අතර ගාස්තුද වෙන් වෙන් වශයෙන් ගෙවිය යුතුය.
4. තැපැල මඟින් අයදුම්පත් ඉදිරිපත් කරන්නේ නම් **සභාපති, ජා ඇල නගර සභාව** නමින් ලියන ලද චෙක්පතකින් පමණක් ගෙවිය හැකිය.මුදල් ඇණවුම් භාර ගනු නොලැබේ.
5. කොන්ත්‍රාත් සඳහා ලියාපදිංචි වීමේදී රජයේ ඉදිකිරීම් හා පුහුණු ආයතනයේ (ICTAD) ලියාපදිංචි වී සිටිය යුතු අතර,අයදුම්පත සමග අදාළ ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.
6. එකතු කළ අගය මත බද්ධ(VAT) සඳහා ලියාපදිංචි වී ඇති ආයතනය ඒ බව සනාථ කිරීම සඳහා VAT ලියාපදිංචි සහතිකයද ඉදිරිපත් කළ යුතුය.
7. සැපයුම්කරුවන්,සේවා සපයන්නන් සහ කොන්ත්‍රාත්කරුවන් ලෙස ලියාපදිංචි වන සෑම ආයතනයක්ම ණය පදනම මත සේවා සැපයීමට එකඟ විය යුතුය.

එස්.ආර්.නෝනිස්
සභාපති,
ජා ඇල නගර සභාව
ජා ඇල.
2026.10.16
011 -2236822

ජා ඇල නගර සභාව
සැපයුම්කරුවන්,කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම 2027

1. ව්‍යාපාරයේ නම හා ලිපිනය: ....
2. අයිතිකරුගේ නම හා ලිපිනය: ....
3. ජාතික හැඳුනුම්පත් අංකය: ....
4. ව්‍යාපාර ලියාපදිංචි සහතික අංකය:...
5. CIDA ලියාපදිංචි අංකය: ....
6. VAT ලියාපදිංචි අංකය: ....
7. සමාගමක් නම් ලියාපදිංචි අංකය:...
8. දුරකථන අංකය:(ස්ථාවර)... (ජංගම)................................
9. ඊ මේල් ලිපිනය: ....
10. ලබා දිය හැකි උපරිම ණය සීමාව සහ කාලය: ....
11. නිෂ්පාදකයෙකුද,බෙදාහරින්නෙක්ද,ව්‍යාපාර තනි අයිතිකරුවෙක්ද යන වග: ....
12. වර්තමාන ගනුදෙනුකරුවන්ගේ නම්: ....
13. ලියාපදිංචි වීමට අපේක්ෂා කරන්නේ සැපයුම්කරුවෙකු /කොන්ත්‍රාත්කරුවෙකු වශයෙන් නම් :
    භාණ්ඩ සැපයීමේ අයිතමය හා අයිතම අංකය ....
    සේවා සැපයීමේ අයිතමය හා අයිතම අංකය ....
    කොන්ත්‍රාත් මුදල් සීමාව ....

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

.... දිනය:..

අයදුම්කරුගේ අත්සන හා නිල මුද්‍රාව

ලියාපදිංචි ගාස්තුව ගෙවන ලද දිනය හා ලදුපත් අංකය : ....